සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 06 - 2023

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) දේව මැවිල්ල පිළිබඳව සඳහන් බයිබල් ග්‍රන්ථය වන්නේ,
(i) උත්පත්තිය (ii) නික්මයාම (iii) ජෙරමියා (iv) එළිදරව්ව

(02) ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුම මුලින්ම ලියන ලද භාෂාව වන්නේ,
(i) ඇරමයික් භාෂාව (ii) ග්‍රීක භාෂාව (iii) ලතින් භාෂාව (iv) හිබෲ භාෂාව

(03) එම්මාවුස් ගමන යමින් සිටි ගෝලයින් ජේසුස් වහන්සේ හඳුනාගන්නේ,
(i) පාරේදී (ii) රොටී කඩද්දී (iii) කතා බහෙන් (iv) ප්‍රාතිහාර්යයෙන්

(04) ජේසුස් වහන්සේගේ බෞතීස්මයේදී ශුද්ධාත්මයාණන් ප්‍රකාශ වූ සලකුණ වන්නේ,
(i) පරවියා (ii) වලාටැබ (iii) ගිණි දැල්ල (iv) සුළඟ

(05) බට පඳුරු අතර සැඟව බලාගත් සොහොයුරා වන්නේ,
(i) ගාබ්‍රියෙල් (ii) සාමුවෙල් (iii) මෝසෙස් (iv) දාවිත්

- අංක 06 - 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

(06) උපස්තාදායකයින් සත් දෙනෙකි. ( )

(07) සිඟමන් යදිමින් සිටියේ අන්ධ බාර්තිමෙයස්ය. ( )

(08) හන්නා සහ එල්කානාගේ පුත්‍රයා ජෝසප්ය. ( )

(09) ජේසුස් වහන්සේගේ ප්‍රධානම ශ්‍රාවකයා ජාකොබ්ය. ( )

(10) කිතුනුවාගේ පූජනීය ග්‍රන්ථය ශුද්ධ බයිබලයයි. ( )

- අංක 11 - 15 තෙක් ප්‍රශ්න සඳහා A කොටසේ දැක්වෙන වගන්ති හා ගැලපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| A | B |
|---|---|
| (11) වයස අවුරුදු 12 දී පාස්කුව සැමරීමට ජේසුස් වහන්සේ පැමිණියේ | මිනිසා ය. |
| (12) දෙවියන් වහන්සේ සයවන දින මවන ලද්දේ | ජේසුස් වහන්සේ ය. |
| (13) ''තාගේ දෙවිවූ ස්වාමීන් වහන්සේ පරීක්ෂා නොකරව'' යැයි පැවසුවේ. | යෙසායා |
| (14) ජේසුස් වහන්සේ කුරුසියේ ඇන ගැසූ ස්ථානය වන්නේ | ජෙරුසලමට ය. |
| (15) නාසරෙත්හි පළමු දේශනයට ජේසුස් වහන්සේ තෝරාගත් පොත වන්නේ | කපාලපිටිය ය. |

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(දෙවියන් වහන්සේ, යෙසායා, සාමුවෙල්, මනස්ථාපවී, උපස්ථායකයින්)

(16) ඉතියෝපීය ජාතික මිනිසා කියවමින් ගියේ ................................ ග්‍රන්ථයයි.

(17) ඒලී දේව පණිවිඩය පහදා දුන්නේ ................................... ට ය.

(18) මුල් සභාව තුළ සහනාධාර බෙදාදීමට සභයට ................................... පත් කරන ලදී.

(19) තම පව් ගැන ................................... කරන කන්නලව්ව දෙවියන් වහන්සේ පිළිගන්නා සේක.

(20) ශුද්ධ බයිබලයේ ප්‍රධාන කර්තෘ ................................... ය.

## II - කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න.

(01) ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(i) දෙවියන් වහන්සේ මවන ලද දේවල් 02 ක් ලියන්න.

(ii) ශුද්ධ බයිබලයේ පළමු සහ අවසාන පොත කුමක්ද?

(iii) මාගේ අසල්වැසියා කව්ද යන්න හඳුන්වා දීමට ජේසුස් වහන්සේ පෙන්වාදුන් උපමා කතාව කුමක්ද?

(iv) දේව මැවිල්ල ආරක්‍ෂා කිරීමට කළයුතු දේවල් දෙකක් ලියන්න.

(v) බයිබලයේ මුල් පොත් පහ හඳුන්වන නමක් ලියන්න.

(vi) සාමුවෙල් යන නමෙහි අර්ථය ලියන්න.

(vii) සජාහන් උමාගේ මව හා පියා නම් කරන්න.

(viii) කිතුනු දරුවකු ලෙස ඔබ තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග 02 ක් ලියන්න.

(ලකුණු 2 × 8 = 16)

(02) (i) දෙවියන් වහන්සේ දෙවන දින මවන ලද දේවල් 02 ක් ලියන්න.

(ii) සබත් දින ශුද්ධ ලෙස ගත කිරීමට කළ යුතු දේවල් 03 ක් ලියන්න.

(iii) දේව මැවිල්ල ආරක්‍ෂා කිරීමට ඔබ කළ යුතු දේවල් 03 ක් ලියන්න.

(ලකුණු 2+3+6)

(03) (i) කිතු උපත පළමුව දැනුම් දුන්නේ කාටද?

(ii) ශාස්ත්‍ර වන්තයින් ජේසුස් වහන්සේට පුදන ලද ත්‍යාග 03 ක් ලියන්න.

(iii) කිතු උපත සැමරීමේදී කිතුනුවන් යොමුවන යහපත් පිළිවෙත් 03 ක් ලියන්න.

(ලකුණු 2+3+6)

(04) (i) ශුද්ධ බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ii) පංච පුස්තකයට අයත් පොත් තුනක් නම් කරන්න.

(iii) දවස බාරකොට තම වැඩ කටයුතු හොඳින් කර ගැනීමට දේව ආශිර්වාදය ඉල්ලා යාච්ඤාවක් ලියන්න. (පේළි 06 යි)

(ලකුණු 2+3+6)

(05) (i) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා ගණන කීයද?.

(ii) ඒවා මොනවාද?

(iii) ඒවාට ජේසුස් වහන්සේ දුන් පිළිතුරු ලියන්න.

(ලකුණු 2+3+6)

(06) (i) ''ජේසුස් වහන්ස, ආචාර්නි අපට කරුණා කළ මැනව'' කී ලාදුරු රෝගීන්ට ජේසුස්වහන්සේ දුන් පිළිතුර ලියන්න.

(ii) පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාවේදී පරිසිවරයා යාච්ඤාවේදී පැවසූ කරුණු 03 ක් ලියන්න.

(iii) දෙවියන් වහන්සේ ඉදිරියේ අපගේ යැදුම් වලදී අප කළ යුතු දේවල් 05 ක් ලියන්න.

(ලකුණු 2+3+6)